(ආ) රු.10,562,984 ක් වූ ආපසු නොගෙවිය යුතු පුස්තකාල තැන්පතු විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීම වෙනුවට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පීඨ කාර්යාල වල හා ප්‍රධාන පුස්තකාලයේ අරමුදල් වලට බැර කර තිබුණි.

**2.2.3 නොසැසඳූ පාලන ගිණුම්**

2012 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛනවල දැක්වෙන ශේෂයන් සහ ණය ලේඛනයෙහි ශේෂයන් අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| ණය වර්ගය | ණය ශේෂ ලේඛනයඅනුව ශේෂය (රු) | මූල්‍ය ප්‍රකාශනඋපලේඛනය අනුව ශේෂය (රු) | වෙනස (රු) |
|---|---|---|---|
| ආපදා ණය | 64,989,641 | 65,200,631 | 210,990 |
| සේවක ණය | 649,740 | 683,209 | 33,469 |
| වාහන ණය | 594,446 | 654,869 | 60,423 |
| පරිගණක ණය | 947,000 | 926,600 | (20,400) |
| විශේෂ ආපදා ණය | 199,826 | 212,728 | 12,902 |

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

විගණනය සඳහා ඉදිරිපත් කළ බැංකු විස්තර අනුව මහපොල ශිෂ්‍යත්ව ආධාර ලැබීම් හා ගෙවීම් ප්‍රමාණ පිළිවෙලින් රු. 71,832,352 ක් හා රු. 72,162,856 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනය අනුව එම ප්‍රමාණ රු. 67,958,203 ක් හා රු. 67,807,400 ක් විය.මෙම ලැබීම් ගෙවීම් අත්තිකාරම් ගිණුමක් මගින් ලේඛන ගත කර තිබුණද එමගින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන්වල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

### 2.2.5 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලටඅනුකූල නොවීම

පහත සදහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 (1) වගන්තිය | මෙම වගන්තිය මගින් සලසා ඇති විධිවිධාන නොසලකා 2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය විසින් උපයන ලද මුදල් රු.111,262,388ක් විශ්වවිද්‍යාලයේ පීඨවල හා අධ්‍යයන අංශවල පිහිටුවා ඇති විවිධ අරමුදල් ගිණුම්වලද, ගිවිසුම් හා බැදුම්කර කඩ කරන ලද පාර්ශවයන්ගෙන් ආපසු අයකරගත් රු.41,717,589 ක් ගිවිසුම් හා බැදුම්කර කඩකිරීමේ අරමුදලකට සහ එහි පොලී අදායම රු.14,892,785 ක් පොලී අරමුදලකටද, භාණ්ඩාගාර අනුමැතියකින් තොරව බැර කර තිබුණි. |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1) වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා අදාල පොත්පත් ලේඛන පවත්වා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගෙවූ රු. 620,146,097 ක වැටුප් හා දීමනා වල නිවැරදිතාව තහවුරු කරගත නොහැකි විය. |

| | |
|---|---|
| 2009 ජනවාරි 07 දිනැති 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත හා 2006 අප්‍රේල් 01 දිනැති අංක 2006 අංක 13) දරන ආර්ථික සේවා ගාස්තු පනත | ජාතිය ගොඩනැගීමේ බදු හා ආර්ථික සේවා ගාස්තු ගණනය කිරීමේදි විවිධ ආදායම් හා පාඨමාලා ආදායම් අත්හැර ඇති අවස්ථා විගණනයේදි නිරීක්ෂණය වූ අතර, ඒ අනුව සිදුකල නියැදි පරීක්ෂාවට අනුව ජාතිය ගොඩනැගීමේ බදු රු. 241,765 ක් හා ආර්ථික සේවා ගාස්තු රු. 30,221 ක් ගෙවා නොතිබුණි. |
| 2010 නොවැම්බර් 13 දිනැති හා අංක 438 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2010 පෙබරවාරි 24 දිනැති අංක 01/2010 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය. | 2012 වර්ෂයේ රාගම වෛද්‍ය පීඨයේ තොග සමීක්ෂණයේදි නිරීක්ෂණය වූ රු. 319,268 ක් වූ කල් ඉකුත් වූ ද්‍රව්‍ය අයිතම 52 ක් අපහරණය කිරීම සඳහා 2013 පෙබරවාරි 27 දින තෙක් කටයුතු කර නොතිබුණි. |
| 2003 ජුනි 02 දිනැති හා අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 7.4.5 ඡේදය | 2002 දෙසැම්බර් 31 දිනෙන් පසු වසර 09 ක කාලයක් තුල පුස්තකාල පොත් සමීක්ෂණයට භාජනය කර නොතිබු අතර, 2012 වර්ෂය සඳහා පුස්තකාල පොත් සමීක්ෂණයක් කර තිබුණද, අවසන් වාර්තාව 2014 ජනවාරි 27 දින දක්වා ඉදිරිපත් කර නොතිබුණි. |
| 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර ලේකම්ගේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියෙන් තොරව විශ්වවිද්‍යාලයේ පාලක සභාව අනුමත කර ඇති නිර්ණායක මත ගාස්තු අයකරන පාඨමාලාවන් සඳහා සාමාන්‍ය රාජකාරි වේලාවන් තුලදී මෙන්ම සති අන්ත රාජකාරි සඳහා විවිධ දීමනාවන් හා ගාස්තු ලෙස රු.31,999,039 ක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| 1978 අංක 842 හා 1978 දෙසැම්බර් 19 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

----------------------

3.1 **මූල්‍ය ප්‍රතිඵලය**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 1,107,103,850 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,077,184,260 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 1,255,880,000 ක ප්‍රදාන හේතුකොට ගෙන සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තය රු. 148,776,150 ක් විය. ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 1,150,121,000 ක ප්‍රදානය හේතු කොට ගෙන එම වර්ෂයේ ඌනතාවය රු.72,936,740 ක අතිරික්තයක් බවට පත්විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.75,839,410 ක මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට රජයේ ප්‍රදාන රු.105,759,000 කින් හා ආයෝජන පොලී ආදායම් රු. 61,854,896 කින් වැඩි වීම විශේෂයෙන් බලපා තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

4.1 **කාර්ය සාධනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ එක් එක් අධ්‍යයන වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව, විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව සහ අවසන් විභාගයෙන් සමත් ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ නිවැරදි දත්ත විගණනය වෙත ඉදිරිපත් නොකරන ලද බැවින් අධ්‍යයන කාර්යය සාධනය පිළිබඳව විගණනයේදී පරික්ෂා කිරීමට නොහැකි විය.

(ආ) වාණිජ්‍ය හා කලමනාකරණ සහ මානව ශාස්ත්‍ර යන පීඨ දෙකෙහි විභාග ප්‍රතිඵලනිකුත් කිරීමේදී මාස 1 ½ ත් මාස 2 ½ ත් අතර ප්‍රමාදයන් සිදුව ඇති බව නිරීක්ෂණය වූ අතර වාණිජ්‍ය හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ප්‍රථම අර්ධ වර්ෂයට අදාල විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා අවසාන දිනය 2012 ඔක්තෝබර් 19 දින ලෙස තීරණය කර තිබුණද, එම පීඨයේ විෂයයන් 17 ක් සඳහා දෙවන ලකුණු ලේඛණ භාර දීම එම දිනයට පසුව සිදු කර තිබූ බවද නිරීක්ෂණය විය.

(ඇ) වෛද්‍ය විද්‍යා පීඨයේ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව හා විභාග සමත් සිසුන් සංඛ්‍යාව සහ සමත් වූ ශිෂ්‍ය ප්‍රතිශතය පහත වගුවෙන් දැක්වේ.

| අධ්‍යයන වර්ෂය | ඇතුලත් සිසුන් සංඛ්‍යාව | අතහැර ගියසිසුන් සංඛ්‍යාව | දැනට සිටින සිසුන් සංඛ්‍යාව | විභාග සමත් වූ සිසුන් සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2005/06 | 198 | - | - | 134 (2011) | 68% |
| 2006/07 | 165 | - | - | 118 (2012) | 72% |
| 2007/08 | 184 | 9 | 175 | | |
| 2008/09 | 187 | 9 | 178 | | |
| 2009/10 | 174 | 7 | 167 | | |
| 2010/11 | 171 | - | 171 | | |

(ඈ) <u>පර්යේෂණ ආධාර උපයෝජනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) පර්යේෂණ ආධාර ලෙස ඒකාබද්ධ අරමුදලින් 2012 වර්ෂය සඳහා එක් පීඨයකට රු.මිලියන 01 බැගින් රු. මිලියන 06 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර, 2012 වර්ෂයේ පර්යේෂණ කමිටුව විසින් රු.2,641,975 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 10 ක් අනුමත කර තිබුණි. 2013 සැප්තැම්බර් 16 දිනට එහි උපයෝජනය රු.850,069 ක් එනම් අනුමත වූ පර්යේෂණ ව්‍යාපෘති වටිනාකමින් සියයට 32 ක් පමණි.

(ii) 2012 වර්ෂය සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා අනුමත වූ රු.1,141,975 ක් වූ පර්යේෂණ යෝජනා 05 ක් සම්බන්ධයෙන් 2013 සැප්තැම්බර් 16 දක්වා කිසිදු උපයෝජනයක් සිදු කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ ආධාර සඳහා එක් පීඨයකට, රු.මිලියනයබැගින් ප්‍රතිපාදනයකර තිබුණද, මානව ශාස්ත්‍ර පීඨය, විද්‍යා පීඨය හා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විසින් පර්යේෂණ යෝජනා ඉදිරිපත් නොකිරීම සහ ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් සියයට සියයක් එනම් රු.3,000,000ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(iv) පර්යේෂණයන්හි ප්‍රගතිය සම්බන්ධයෙන් 2012 වර්ෂයේ අනුමත පර්යේෂණ ව්‍යාපෘති 10 ට අදාලව පර්යේෂණ ප්‍රගති වාර්තා ඉදිරිපත් කර තිබුණේ ආචාර්යවරුන් දෙදෙනෙකු පමණි.

(v) **<u>පර්යේෂණ දීමනා ගෙවීම</u>**

2011 අප්‍රියෙල් 07 දිනැති අංක 45 දරන කළමණාකරන චක්‍රලේඛය ප්‍රකාර වැටුපෙන් සියයට 25 පර්යේෂණ දීමනා ගෙවීම වෙනුවෙන් 2012 වර්ෂය සඳහා රු.මිලියන 55 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, වර්ෂයතුළ ආචාර්යවරු 472 කට රු.53,418,537 ක මුදලක් ගෙවා තිබුණි. පර්යේෂණයන්හි 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය පිළිබඳ නිසි ඇගයීමක් සිදුකර නොතිබුණු බව ලිපිගොනු පරික්ෂාවේදී අනාවරණය විය.

(vi) **<u>පර්යේෂණ පරිසංවාද පැවැත්වීම</u>**

සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ පරිසංවාද 13 ක් පවත්වා තිබූ අතර, ඒ සඳහා පසුගිය වර්ෂවලට අදාලව ඉදිරිපත්කළ පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව 165 ක් විය. ඊට අනුරූපව ඉකුත් වර්ෂය අවසානයේ පරිසංවාද 12 ක් පවත්වා තිබූ අතර, ඉදිරිපත්කර තිබූ පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව 185 ක් විය.

(vii) ලෝක ශ්‍රේණිගත කිරීමටඅදාල නිර්ණායකයන් වලට අනුව පර්යේෂණ නිර්ණායකයන් වැදගත් වන බැවින් ලෝක ශ්‍රේණිගත කිරීම අනුව කැලණිය විශ්වවිද්‍යාලය 2012 වර්ෂයේදී 3048 වන තත්ත්වයේ පැවතියද, 2013 වර්ෂයේදී 3430 ක් දක්වා පහත බැස තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට ආචාර්යවරුන් 04 ගෙන් අයකර ගත යුතු රු.22,295,186 ක් අදාල පාර්ශවයේ ඉල්ලීම මත වාරික වශයෙන් ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණු අතර ඒ සම්බන්ධව ලිඛිත ප්‍රකාශයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වාණිජ්‍ය හා කළමනාකරණ පීඨයේ විභාග පිළිතුරු පත් පරික්ෂා කිරීමේදී මාස 02 ක් හෝ මාස 03 ක් තුළ පරීක්ෂණ නිම කිරීම සඳහා දිරිදීමනාවක් පාලක සභා අනුමැතියෙන් ගෙවා තිබූ අතර නියැදි පරික්ෂාවට අනුව, කථිකාචාර්යවරයෙක් විභාග උත්තර පත්‍ර භාරගත් හා භාරදුන් දිනයන් වෙනස් කර ගෙවීම් වව්චර් සකස් කර රු.99,470 ක් වැඩිපුර ලබා ගෙන තිබුණි.

4.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>ගෙවිය යුතු ලංසු හා ආරක්ෂක තැන්පතු</u>

වර්ෂ 01-06 දක්වා කාලයක සිට පැවතෙන රු.24,839,277 ක් වටිනා ගෙවිය යුතු ලංසු හා ආරක්ෂක තැන්පතු 2013 දෙසැම්බර් 31 දින දක්වා ගෙවා නිරවුල් කිරීමට වගකිව යුතු නිලධාරින් විසින් කටයුතු කර නොතිබුණි. කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| විස්තරය | වර්ෂ1-2 අතර | වර්ෂ 2-3 අතර | වර්ෂ 3-4 අතර | වර්ෂ 4ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ටෙන්ඩර් තැන්පතු | 87,423 | 5,730 | 66,214 | 75,300 | 234,667 |
| ආරක්ෂක තැන්පතු | 5,563,237 | 3,455,854 | 7,168,564 | 8,416,955 | 24,604,610 |

(ආ) බැඳුම්කර හා ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් අය විය යුතුව ඇති රු.204,631 ක ණය ශේෂ පවතින බව නියැදි පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

4.4 **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

-----------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට බාහිර ආයතනවලින් ලද පර්යේෂණ ආධාර අරමුදල් රු.3,584,044 ක් 2009 වසරේ සිට වර්ෂ 04 ක කාල පරිච්ඡේදයක් තුල උපයෝජනයකින් තොරව නිශ්ක්‍රීයව පැවති බව නිරීක්ෂණය විය.

(ආ) පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ විදේශ සිසුන් වෙනුවෙන් නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා 2011 සැප්තැම්බර් 06 දින ඇමරිකානු ඩොලර් 50,000 ක එනම් රු.5,423,868 ක ප්‍රදානයක් චීනබෞද්ධ සංගමය මගින් ලබා දී තිබූ අතර එදින සිට විගණිත දිනය වූ 2013 ජූලි 18 දින වන විට මූලික සැලසුම් පමණක් සකස්කර තිබුණි. විශ්වවිද්‍යාලය විසින් බාහිර ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා බදුකුලී වශයෙන් වර්ෂයකට රු.3,380,615 ක පමණ මුදලක් වැයකර තිබුණද ලැබුණු අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා නේවාසිකාගාරයේ ඉදිකිරීම් ප්‍රමාද වී තිබුණි.

## 4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

කොන්ත්‍රාත් වටිනාකම රු.17,022,604 ක් වූ නවීන ආපනශාලා ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු 2009 අගෝස්තු 10 දින ආරම්භකර තිබූ අතර 2010 අගෝස්තු 19 දින ඉදිකිරීම් නිම කර භාවිතයට යොදාගෙන තිබුණි. කොන්ත්‍රාත්කරුට රු.16,769,923 ක් ගෙවීම් කර තිබුණද කොන්ත්‍රාත්කරු අවසන් බිල්පත නිවැරදි කර ඉදිරිපත්කර නොතිබූ බැවින් වර්ෂ 03 ක් ගත වුවද වියදම් ප්‍රාග්ධන ගත නොකර කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. 2012 වර්ෂය තුල මිලදී ගත් රු.2,320,162 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගැනීම්ද මෙම වියදමට එකතුකර කෙරීගෙන යන වැඩ ලෙස රු.19,090,086 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 4.6 කාර්යය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩලය සහ පුරප්පාඩු පිළිබඳ විස්තර පහත දැක්වේ.

අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| **අධ්‍යයන අංශය** | | | |
| මහාචාර්ය | 120 | 107 | 13 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 239 | 235 | 04 |
| ආධුනික කථිකාචාර්ය | 237 | 168 | 69 |
| පුස්තකාලකාර්ය මණ්ඩලය | 13 | 12 | 01 |
| | **609** | **522** | **87** |
| **අනධ්‍යයන අංශය** | | | |
| පරිපාලන, විධායක හා වෙනත් ශ්‍රේණි | 17 | 07 | 10 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | 37 | 12 | 25 |
| ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | 758 | 631 | 127 |
| | **812** | **650** | **162** |

අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිළිවෙලින් 87 ක් හා 162 ක් පිරවීමට ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.7 සේවක පාරිතෝෂික වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම.

---------------------------------------------------------------

සේවක පාරිතෝෂික සඳහා 2012 දෙසැම්බර් 31 දිනට  රු.312,514,830 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර අරමුදලක් ගොඩනැගීමට හා එම මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 5.1 ක්‍රියාකාරි සැලැස්ම

---------------------

ක්‍රියාකාරි  සැලැස්මේ ඉලක්ක ඉටු කර ගැනීමේ ප්‍රගතිය ත්‍රෛමාසිකව හෝ අර්ධ වාර්ෂිකව හෝ ඇගයීම් කරප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන්  විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

විශ්වවිද්‍යාලය විසින් 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට  10  සිට  සියයට 1288 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් පැවති අතර අයවැය ලේඛනය මුල්‍ය කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.4 නොවිස දී ඇති විගණන ජේද පිළිබඳ නිරීක්ෂණ

--------------------------------------------------

2009,2010 සහ 2011 වර්ෂවලදී විදේශීය වෛද්‍ය සිසුන් ගෙන් ලද පාඨමාලා ආදායම් රු.82,580,947 ක් ඒ ඒ වර්ෂවල ආදායමට ඇතුලත් කර නොතිබුණු අතර2012 වර්ෂයේදී ද ලද පාඨමාලා ආදායමින් සියයට 85 ක් එනම්  රු.25,038,437 ක්  ආදායමට නොගෙන  වැය නොකල ප්‍රදාන ගිණුමකට බැර කර තිබුණි.

## 6. **පද්ධති හා පාලනය**

----------------------

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත දැනුම් දෙන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.**

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) ශාස්තෘ අයකර පවත්වනු ලබන පාඨමාලා ආදායම්

(ඇ) වාහනඋපයෝජනය

(ඈ) නේවාසිකාගාර පාලනය

(ඉ) පුස්තකාල පාලනය

(ඊ) අත්තිකාරම් පාලනය

(උ) පර්යේෂණ ගිවිසුම්

(ඌ) ගබඩා පාලනය.

# 22. විගණන කමිටු වාර්තාව - 2012

## විගණන කමිටුවේ සංයුතිය

පාලක සභාවට වගකිව යුතු උප කමිටුවක් ලෙස ස්ථාපනය කර ඇති විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව විධායක නොවන සභා සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. 2012 වසරේ දී පහත සඳහන් සාමාජිකයින් විගණන කමිටු කාර්යයන්හි නියුක්ත වූහ.

| සාමාජික (සහභාගිවීම/සහාභාගිවීමට නියමිත) | 2012 වසරේ දී කමිටුවට සහභාගීවීම |
|---|---|
| 1. හරිශ්චන්ද්‍ර වාසලතන්ත්‍රි මහතා (සභාපති) | 4/4 |
| 2. ආචාර්ය ආර්.බී.ඒකනායක මහතා | 4/4 |
| 3. එල්. ජේ. පැට්රික් ඇලෙක්සීස් සිල්වා මහතා | 4/4 |

ඉහත සඳහන් සාමාජිකයන්ට අමතරව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සාමාජිකයන්ට ද නිරීක්ෂකයින් ලෙස සහභාගී වීම සඳහා ආරාධනා කරන ලදී.

### රැස්වීම

පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී/31 අනුව වසරකට සිව් වතාවක්වත් කමිටුව රැස්විය යුතු ය. සලකා බලන ලද වර්ෂය තුළ කමිටුව සිව් වතාවක් රැස් වූ අතර මෙම රැස්වීම්වල දී අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සාකච්ඡාවට ගන්නා ලදී. දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා කමිටු වාර්තා විශ්වවිද්‍යාලයේ පාලක සභාවට ලබා දෙන ලදී.

### මූලික වගකීම්

විගණන කමිටුවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කටයුතු ඵලදායී ලෙස කරගෙන යාම සඳහා පාලක සභාවට සහාය වීම යි.

මූලික වගකීම් වනුයේ

1. මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තාකරණය සහ විගණන ක්‍රියාවලියේ අඛණ්ඩතාවය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
2. විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කටයුතුවලට අදාළ ඕනෑම කාරණයක් පරීක්ෂා කිරීම.
3. අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩසටහන අධීක්ෂණය කිරිම.
4. බාහිර සහ අභ්‍යන්තර විගණන වාර්තා විමර්ශනය කිරීම සහ නිර්දේශයන් සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදුකිරීම.
5. අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායි ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම.
6. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම් සහ වැඩසටහන් අනුමත කිරීම.

**වසර තුළ ක්‍රියාකාරකම්**

විමර්ශනයට ලක් කරන ලද වසර තුළ කමිටුව පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත විය.

1. **අභ්‍යන්තර විගණන සැලසුම් සහ වැඩ සටහන් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම.**

   2012 වසර සඳහා වූ  අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන වැඩසටහන කමිටුව අනුමත කර වසර මුළුල්ලේ ම එහි තත්ත්වය අධීක්ෂණය කළේය. කමිටුව අභ්‍යන්තර විගණනයේ ඵලදායීතාවය, විමසුම්වල ක්‍රියාකාරීත්වය සහ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරීත්වය සමාලෝචනය  සහ අධීක්ෂණය කළේ ය.

2. **නීති සහ රෙගුලාසි සමඟ අනුකූලතාවය**

   අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලතාවය සහ පාරිතෝෂික ගෙවීම් සහ අර්ථසාධක අරමුදල් ශේෂ නිදහස් කිරීම වැනි ව්‍යවස්ථානුකූල ගෙවීම් නිරවුල් කිරීමේ තත්ත්වය පිළිබඳ බාහිර සහ අභ්‍යන්තර විගණකවරු විසින් ඉදිරිපත් කරන ලද වාර්තා විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. ප්‍රගතිය තහවුරු කිරීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රමාදවී තිබූ අර්ථසාධක අරමුදල් ශේෂ නිදහස් කිරීම  සම්බන්ධව පවතින පාලන ක්‍රම කමිටුව විසින් අඛණ්ඩව සමාලෝචනය කරන ලදී.

3. **ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් අඛණ්ඩ සමාලෝචනය සහ අධීක්ෂණය**

   ගිවිසුම් කඩකරන ලද කාර්යය මණ්ඩල සාමාජිකයන්ගෙන් ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අඛන්ඩව සමාලෝචනයට සහ අධීක්ෂණයට ලක්විය. මෙම ක්‍රියාවලිය නිසා 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ගිවිසුම් කඩකරන ලද  කාර්යය මණ්ඩල සාමාජිකයින් 26 දෙනෙකුගේ මුළු බැඳුම්කර වටිනාකම ලෙස රු.මිලියන 34 කට ආසන්න මුදලක් විශ්ව විද්‍යාලයට අයකර ගැනීමට හැකියාව ලැබුණි. 2012 වර්ෂයේ ආරම්භයේ බැදුම්කර කඩවූන් 15 දෙනෙකු සිටින ලදි. පස් දෙනෙකුගේ මුළු බැදුම්කර වටිනාකම වර්ෂයතුළ අයකර ගැනීමට හැකියාව ලැබුණ  අතර 04 දෙනෙකු වාරික වශයෙන් ගෙවමින් සිටී. 03 දෙනෙකුගෙන් අයවීම් අයකර ගැනීමට ඔවුන්ට එරෙහිව දැනටමත් නීතිමය පියවර ගෙන ඇත. තවත් 03 දෙනෙකුට එරෙහිව නීතිමය පියවර ගනිමින් සිටියි.

4. **අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම හා ශක්තිමත් කිරීම.**

   කමිටුව මූල්‍ය වාර්තාකරණය සහ විශ්වවිද්‍යාලයේ වාහන පරිපාලනය, කොන්ත්‍රාත් පරිපාලනය, ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම, පුස්තකාල පොත් නිකුත් කිරීම, වාර්ෂික ගබඩා සමීක්ෂණ / බඩු වට්ටෝරු සමීක්ෂණ, නොපිය වූ අත්තිකාරම් අය කර ගැනීම යන ප්‍රධාන ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය සමාලෝචනය කිරීමත් සහ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරිම සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබා දීම තුළින් මෙම අංශයන්හි සැලකියයුතු ප්‍රගතියක් ලගාකරගෙන ඇත.රාගම වෛද්‍ය පීඨයේ වෛද්‍ය ප්‍රදර්ශනයෙන් ලැබුණු ආදායම් හා වියදම් සම්බන්ධව කමිටුව සමාලෝචනය කර එහි නිසි ගිණුම් වාර්තා හා ක්‍රියාපිළිවෙත් පවත්වාගෙනයාම සම්බන්ධව අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදි. තවද විගණකාධිපති විසින් වර්ෂය තුළ නිකුත් කරන ලද විගණන වාර්තා හා විගණන විමසුම් වලින් පෙන්වා දෙන ලද දුර්වලතාවයන් සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ පසුවිපරම් කටයුතු අඛන්ඩව සමාලෝචනය කරන ලදී.

**5. විගණන කමිටු රැස්වීම්**

2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර තුළ විගණන කමිටුව සිව් වතාවක් රැස්විය. ආරාධිත නිරීක්ෂකයෙකු ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් සෑම විගණන කමිටු රැස්වීමකට ම සහභාගි විය. විශ්වවිද්‍යාලයේ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය වූ විට පැමිණීම සඳහා ආරාධනා කරන ලදී. ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක, කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

**නිගමනය**

2012 වසර තුළ කමිටුව විසින් සළකා බලන ලද කරුණු සම්බන්ධයෙන් ලබාදෙන ලද නිර්දේශ මත පසුවිපරම් කටයුතු සිදුකිරීමේ සාර්ථකත්වය පිළිබඳව කමිටුව සෑහීමකට පත්විය.

**සභාපති**
**විගණන කමිටුව**
**කැලණිය විශ්වවිද්‍යාලය**

## 23. විගණනය පිළිබඳව කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිරීක්ෂණය

**කැලණිය විශ්වවිද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපතිවාර්තාව.**

ඔබගේ ඉහත සමාංක හා 2014 අප්‍රේල් 11 දින දරණ ලිපිය සමඟ ඉදිරිපත් කරන ලද 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ගිණුම් පිළිබඳ විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්ති ප්‍රකාර වූ විගණකාධිපති වාර්තාව 2014.06.10 දින පැවති අංක 415 වන පාලක සභාවේ දී සලකා බැලීමෙන් අනතුරුව එම වාර්තාවේ දැක්වෙන නිරික්ෂණවලට අදාළ පැහැදිළි කිරීම් පහත ඉදිරිපත් කරමි.

1.3.විගණනයේ වගකීම

2. මූල්‍ය ප්‍රකාශන.

2.1.තත්ත්වාගණනය කළ මතය.

එකඟවේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1. **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.**

(අ). සමාලෝචිත වර්ෂයේදී අවසන් වන පාඨමාලා කණ්ඩායම් 12ක වර්ෂයට අදාළ අතිරික්ත ආදායම ආදායම් ගිණුමටද ගෙන පොදු සංචිතයට ද අවශ්‍ය ගැලපීම් සිදුකර අතිරික්ත මුදල පොදු සංචිතයෙන් අධ්‍යයන සංවර්ධන අරමුදලට ද මාරු කර ඇත.

(ඇ). ගොඩනැගිලි හා ඉඩම්වල තක්සේරු වටිනාකම් වෙන් වෙන්ව ලබා ගැනීමට යොමුකර ඇති අතර එය ලැබුණු පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතී.

1.2.2. <u>ගිණුම්කරණ අඩුපාඩු.</u>

(අ). එකඟ නොවේ. මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් සම්බන්ධයෙන් ද 2012.12.31 දිනට මහපොළ භාරකාර අරමුදලින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් හා බැංකුවෙන් අයවිය යුතු මුදල ලෙස රු.4,645,250/-ක ශේෂයන් හඳුනා ගන්නා ලදී. එහිදී ද අයවිය යුතු මුදල නිවැරදිව ගිණුම්ගත කළයුතු බැවින් 2012 වර්ෂයට පෙර පැවති හඳුනාගත නොහැකි ශේෂය වන රු.3,842,197.62 ක ශේෂය විශ්වවිද්‍යාල ආදායමට බැර කරන ලදී.

(ආ). එකඟ නොවේ. ආපසු නොගෙවන පුස්තකාල තැන්පතු සඳහා 50%ක් ප්‍රධාන පුස්තකාලය වෙනුවෙන් ද ඉතිරි 50% අදාළ පීඨයේ පුස්තකාලය වෙනුවෙන් බැර කරන අතර එය සිදු කරනුයේ පාලක සභාව විසින් අනුමත කර ඇති තීර්ණායකවල සඳහන් පරිදිය. කෙසේ වෙතත් මේ වනවිට හඳුනාගන්නා ලද ආදායම් සියල්ල ආදායම් ගිණුම්වලට බැරකර ඇති අතර සංශෝධිත ගිණුම්වල නිවැරදි කර ඇත.

2.2.3. **නොසැසඳු පාලන ගිණුම්.**

(අ)ණය ගිණුම්වලින් හඳුනාගන්නා ලද දෝෂ නිවැරදි කර ගිණුම් සංශෝධනය කර ඉදිරිපත් කර ඇත.

| ණය වර්ගය | ණය ශේෂය ලේඛනයට අනුව | ගිණුම් උපලේඛන අනුව | සොයාගත් වෙනස | නව වෙනස |
|---|---|---|---|---|
| ආපදා | 64,867,948.73 | 65,200,631.00 | 121,692.00 | 210,990.27 |
| සේවක | 641,070.00 | 683,209.00 | 8,670.00 | 33,469.00 |
| වාහන | 588,446.00 | 654,869.59 | 6,000.00 | 60,423.59 |
| පරිගණක | 947,000.00 | 926,600.00 | -- | (20,400.00) |
| විශේෂ ආපදා | 165,104.00 | 212,727.98 | 34,722.00 | 12,901.98 |

පසුගිය වසර කිහිපයක සිට පැවත එන ගැටළු සහගත තත්ත්වය මත වූ ණය ශේෂයන් වර්ෂ කිහිපයක් ආපසු පරික්ෂා කර නිවැරදි කරන ලද සංශෝධනයන් සහිත උපලේඛනය විගණනයට ඉදිරිපත් කර ඇති අතර ඉතිරි ශේෂයන් නිවැරදි කිරීමට තවදුරටත් පරික්ෂා කරමින් පවතී. තවද විශේෂ ආපදා ණය ගිණුමේ සොයාගත් වෙනස 2014 වර්ෂයේ ජ'නල් අංක R - 110 මඟින් නිවැරදි කර ඇත.

2.2.4. **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

(අ). මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත්තේ ගිණුම් වර්ෂයට අදාළ ලැබීම් හා ගෙවීම් පමණකි.

එම ගෙවීම්වලට අදාළ තොරතුරු 2013 වර්ෂයේ දී හඳුනාගෙන ඇති අතර, මේ වනවිට ඒ සඳහා උපලේඛන පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

2.2.5. **නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

(අ). 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ
99(1) වගන්තිය

විශ්වවිද්‍යාල පාලක සභාව අනුමත කර ඇති ගාස්තු අයකර පවත්වනු ලබන පාඨමාලාවල නිර්ණායකයන්හි සඳහන් පරිදි පාඨමාලා ආදායමෙන් කොටසක් විශ්වවිද්‍යාලයේ සහ පීඨවල ඉදිරි සංවර්ධන කටයුතු වෙනුවෙන් වෙන්කර තබා ගැනීමේ අරමුණින් මෙලෙස කටයුතු කර ඇත. මෙම මුදල් ගිණුම් තැබීමේ පහසුවසඳහා වෙනම පවත්වාගෙන යනු ලැබුවද එම සියලුම අරමුදල් පිළිබඳ විස්තර විශ්වවිද්‍යාල අවසන් ගිණුම්වල හෙළිදරව් කර ඇත. මෙමඟින් විශ්වවිද්‍යාලයේ දියුණුවසඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගනී.

ගිවිසුම් කඩකිරීම වෙනුවෙන් අයකරනු ලබන මුදල් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1998.08.15 දින සියලුම විශ්වවිද්‍යාල වෙත නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ අංක 737 ට අනුව කටයුතු කර ඇත.

(ආ). දැනට අනෙකුත් විශ්වවිද්‍යාල අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන්ට අනුව මෙම විශ්වවිද්‍යාලයේ ද අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් සිදු කරනු ලබන දේශන / ප්‍රායෝගික කටයුතු ආදියේදී එම කාලසීමාවන් සනාථ කෙරෙන පරිදි ආචාර්යවරුන් විසින් අත්සන් කරන ලද ශිෂ්‍ය සහභාගිත්වය සඳහන් ලේඛන ඒ ඒ අධ්‍යයන අංශ මඟින් පවත්වාගෙන යනු ලැබේ. එමඟින් අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීම පිළිබඳ සනාථ කරගත හැකිය. තවද සෑම මාසයකදීම වැටුප් ගෙවීමට ප්‍රථම ඒ ඒ අධ්‍යයනාංශ ප්‍රධානවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන කාර්යය මණ්ඩල වැටුප් ලැයිස්තු (Pay

Abstract) වල අදාළ කාර්යය මණ්ඩල සේවයේ යෙදී සිටි බවට අංශ ප්‍රධාන විසින් ඉදිරිපත් කරනු ලබන තහවුරු මත වැටුප් හා දීමනා ගෙවනු ලබයි. කෙසේ වුවද මේ සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් ඉදිරියේ දී පොදු ප්‍රතිපත්තියක් ඉදිරිපත් වුවහොත් ඒ අනුව කටයුතු කිරීමට හැකියාව ඇත.

(ඈ). විගණන අංශය මගින් පෙන්වා දීමෙන් පසු විවිධ ආදායම් සඳහා බදු අයකිරීම ක්‍රමානුකූලවසිදු කෙරේ.

(ඈ). අදාළ ගබඩා තොග අයිතම ඉවත්කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

(ඉ). 2012 සැප්තැම්බර් මස පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදුකර ඇති අතර එහි අවසන් වාර්තාව මේ වනවිට ඉදිරිපත් කර ඇත.

(ඊ). වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට ඉදිරිපත් කරන චක්‍රලේඛ උපදෙස් අනුවස්වයං මූල්‍ය පාඨමාලා ආරම්භ කිරීමත්, එම කටයුතු පවත්වාගෙන යාමටත් උනන්දු කරනු ලැබේ. ඒ අනුව විශ්වවිද්‍යාලය විසින් අවශ්‍යතා සලකා බලා ආදායම් උපයන පාඨමාලා ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ. තවද රජයෙන් වාර්ෂිකව ලබාදෙනු ලබන ප්‍රතිපාදනද සීමාවන අතර විශ්වවිද්‍යාල කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමටත් ඉදිරි සංවර්ධන කටයුතු සඳහාත් මෙම පාඨමාලාවලින් ලැබෙන ආදායම් උපයෝගී කරගනු ලැබේ. එබැවින් මෙම පාඨමාලා අඛණ්ඩව පවත්වාගෙන යාමටත්, ඒවායේ කටයුතු කරනු ලබන අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල වෙනුවෙන් අත්‍යවශ්‍ය වියදම් දැරීමට පාලක සභා අනුමැතිය මත කටයුතු කිරීමට සිදුවිය.

(උ). යාවත්කාලීන කිරීමේ කටයුතු නිමකර ඇත.

3. මූල්‍ය සමාලෝචනය

3.1. මූල්‍ය ප්‍රතිඵලය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්ය සාධනය.

(අ). එකඟ නොවේ. අධ්‍යයන වර්ෂ අනුව කෙටුම්පත් වාර්තාවේ ඉදිරිපත් කර ඇති සංඛ්‍යාත්මක තොරතුරු සම්බන්ධව අපැහැදිලිතාවයක් තිබුණි.

ආ). උත්තර පත්‍ර පළමු පරීක්ෂක ඇගයීමෙන් පසු දෙවන පරීක්ෂක වෙත යොමු කිරීමේ දී ඇතැම් විෂයයන් සඳහා දෙවන පරීක්ෂක ලෙස කටයුතු කරනුයේ බාහිර ආචාර්යවරුන් වන අතර ඇතැම් අවස්ථාවන්හිදී ඒ සඳහා උත්තර පත්‍ර විදේශ රටවලට යවා පරීක්ෂා කිරීම ද සිදු කරනු ලබයි. මෙම තත්ත්වය හේතුවෙන් එම කටයුතු සඳහා යම් කාලයක් ගතවන බැවින් ප්‍රතිඵල නිකුත් කිරීම නියමිත දිනටම සිදු කිරීමට යම් අපහසුතාවයක් පවතින බව දන්වනු කැමැත්තෙමි.

(ඇ) වෛද්‍ය පීඨයට වාර්ෂිකව ඇතුළත් කරගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 160 කි. මීට අමතරව භූතාන් සිසුන් ද ඇතුළත් කෙරේ. වෛද්‍ය සිසුන්ගේ පසුගිය කාර්ය සාධන විශ්ලේෂණය කළ විට භූතාන් සිසුන් වැඩි සංඛ්‍යාවක් නියමිත ප්‍රවීණතාවය නොලබන නිසා පරීක්ෂණවලින් අසමත් වන බව නිරීක්ෂණය විය. මීට අමතරව දේශීය සිසුන්ගෙන් සුළු ශිෂ්‍ය සංඛ්‍යාවක් නියමිත පරිදි අධ්‍යයන පාඨමාලා සම්පූර්ණ කිරීමට අපොහොසත් වීමෙන් නියමිත පරිදි සමත් නොවුවත් ඊටපසු වර්ෂවලදී උපාධිය සම්පූර්ණ කර වෛද්‍ය පීඨයෙන් පිටව යයි. කෙසේ වුවද, වෛද්‍ය උපාධියට අදාළ අධ්‍යයන අවශ්‍යතාවයන් නියමිත ප්‍රමිතියට අනුවසම්පූර්ණ නොකරන කිසිදු උපාධි අපේක්ෂකයෙකුට එම උපාධිය ලබාගැනීමට අවස්ථාව නොලැබෙන බව දන්වමි.

(ඇ). **පර්යේෂණ ආධාර උපයෝජනය.**

i. 2012 වර්ෂයේ පර්යේෂණ කමිටුව විසින් පර්යේෂණ ව්‍යාපෘති 10 ක් සඳහා රු.2,641,975.00 ක මුදලක් අනුමත කර ඇති අතර මේ දක්වා එම අනුමත ප්‍රතිපාදනවලින් රු.1,074,769.36ක මුදලක් වියදම් කර ඇත. ආචාර්යවරුන් දෙදෙනෙක් සිය පර්යේෂණ ව්‍යාපෘති මේ වනවිට අවසන් කර ඇත.

ii. මේ වනවිට එක් ආචාර්යවරයෙකු හැර පර්යේෂණ ආධාර ලබාගත් සියලුම ආචාර්යවරුන් මුදල් ලබාගෙන සිය ව්‍යාපාති ආරම්භ කර ඇත. එම ආචාර්යවරයා ආචාර්ය උපාධිය සඳහා විදේශ ගතවී ඇත. (අංක iv යටතේ මේ පිළිබඳව විස්තර දක්වා ඇත.)

iii. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා වෙන්කර ඇති මුදල් පර්යේෂණ පරිසංවාදය සඳහා යොදා ගැනීම සිදුවේ. ඒ අනුව 2012 වසරේ පර්යේෂණ පරිසංවාදය පවත්වා ඇත. මානව ශාස්ත්‍ර පීඨයේ 2012 වර්ෂය සඳහා පර්යේෂණ ප්‍රතිපාදන ඉල්ලුම්පත් ඉදිරිපත් කර නොමැත. විද්‍යා පීඨයෙන් 2012 වර්ෂය සඳහා එක් පර්යේෂණ ව්‍යාපෘතියක් අනුමත වී ඇති අතර එම පර්යේෂක මහත්මිය පෞද්ගලික හේතුවක් මත විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත් වූ බැවින් එම පර්යේෂණ ව්‍යාපෘතියේ සම පර්යේෂක ලෙස කටයුතු කළ මහාචාර්යවරයා විසින් එම පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රධාන පර්යේෂක ලෙස කටයුතු කිරීමට අනුමැතිය ඉල්ලූ අතර, ඒ සඳහා 2013 වර්ෂයේ අනුමැතිය දෙන ලදී. ඉන් අනතුරුව එම මහතා විසින් 2013.10.04 දින මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා රු.75,000/-ක මුදලක් උපයෝජනය කරගෙන ඇත.

iv. 2012 වර්ෂයේ වෛද්‍ය පීඨය සඳහා අනුමත කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 02 ක් මේ වනවිට අවසන් කර ඇති අතර ඉතිරි පර්යේෂණ ව්‍යාපෘති සඳහා ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොමැති පර්යේෂකවරුන් වෙත සිහිකැඳවීම් ලිපි යවා ඇත. අනෙකුත් පීඨවල පර්යේෂකවරුන් විසින් නිසි පරිදි ප්‍රගති වාර්තා ඉදිරිපත් කර ඇත. වානිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ 2012 වර්ෂයේ එක් ර්යේෂණ ව්‍යාපෘතියක් අනුමත කර ඇති අතර එම පර්යේෂකවරයා සඳහා 2012.02.13 දින සිට 2015.02.12 දින දක්වා වර්ෂ 03 ක අධ්‍යයන නිවාඩු අනුමත කර ඇති බැවින් මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා මෙතෙක් මුදල් උපයෝජනය කර නොමැත. මේ පිළිබඳව 2014.05.13 දින පවත්වන ලද 2014/05 අංක දරණ පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවට වාර්තා කළ අතර මෙම පර්යේෂණ ව්‍යාපෘතිය අවලංගු කිරීමට සනාතන සභා සහ පාලක සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන ලදී.

v. **පර්යේෂණ දීමනා ගෙවීම.**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2011.04.20 දිනැති අංක 1/2011 දරණ චක්‍රලේඛයේ 03 (iii) වගන්තිය ප්‍රකාරව ඉහත පර්යේෂණ දීමනා ගෙවා ඇත. එම වගන්තියට අනුව පර්යේෂණ යෝජනාවක් පර්යේෂණ කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසු ඉහත දීමනාව ලබාගැනීමට හිමිකම් ලබයි.

vi. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මගින් සංවිධානය කරනු ලබන පර්යේෂණ පරිසංවාද සඳහා පර්යේෂණ උද්ධෘතයන් (Research abstracts) ඉදිරිපත් කිරීම අනිවාර්යය නොවන අතර ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ ඕනෑම පර්යේෂණ සම්මන්ත්‍රණ සඳහා එම පර්යේෂණ උද්ධෘතයන් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. ඒ අනුව එවැනි පර්යේෂණ සම්මන්ත්‍රණ සඳහා ආචාර්යවරු ඉදිරිපත් කරන ලද පර්යේෂණ ව්‍යාපෘති සැලකීමේදී මෙම සංඛ්‍යාවට වඩා ඉහළ අගයක් ගනී.

vii. මේ වනවිටත් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකුගේ (Reserch Council) ප්‍රධානත්වයෙන් පර්යේෂණ මණ්ඩලයක් ස්ථාපිත කර ඇති අතර එමගින් සියලුම පීඨවල සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පර්යේෂණ පිළිබඳ තොරතුරු එක්රැස්කර අන්තර්ජාතික ලෙස ප්‍රසිද්ධියක් ලබාදීමට වැඩපිළිවෙලක් හඳුන්වා දී ඇත. එමගින් ඉදිරියේ දී විශ්වවිද්‍යාලය ලෝක ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීමට අපේක්ෂිතය.

## 4.2. <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) එකඟ නොවේ. ගිවිසුම් හා බැඳුම්කර කඩවූ ආචාර්යවරුන්ගේ ඉල්ලීම් සලකා බලා අදාළ මුදල් ගෙවීමට කාලසීමාවක් සහ එම මුදල් ගෙවිය යුතු ආකාරය පිළිබඳව පාලක සභාවේ අනුමැතිය ඔවුන් වෙත දන්වනු ලබයි. ඒ අනුව ඔවුන් වාරික වශයෙන් හෝ එකවර අදාළ ගෙවීම් සිදු කරනු ලබයි.

(ආ). (ii). දිරි දීමනා ගණනය කිරීම.

මෙම කරුණ සම්බන්ධව 2014.06.05 දින පැවති විගණන කමිටුවේ දී සලකා බැලූ අතර, මෙම ගෙවීම සම්බන්ධවවගකිවයුතු පාර්ශවයන් වෙතින් විමසීම් සිදුකර ඉදිරි පියවර ගැනීමට නිර්දේශ විය.

## 4.3. <u>මෙහෙයුම් ආකාර්යක්මතා.</u>

(අ) <u>ගෙවිය යුතු ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පතු</u>

ආදායමට ගතහැකි ප්‍රමාණය ගණනය කර ජ`නල් සටහන් 408 මගින් ආදායමට ගෙන ඇති අතර ඉතිරි ටෙන්ඩර් ඇප තැන්පතු ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. ආරක්ෂක ඇප තැන්පතු තවදුරටත් රඳවා ගැනීමට අවශ්‍ය බැවින් රඳවා ගෙන ඇත.

(ආ). එකඟ නොවේ. බැඳුම්කර හා ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අයකර ගැනීමට ප්‍රමාද වූ ණය ශේෂ සම්බන්ධ දෙදෙනෙකු (ආචා. ඩී.පී.ඩබ්.ජයවර්ධන මයා හා ඩී.එම්.ජේ.දසනායක මයා) වෙනුවෙන් නඩු පවරා ඇති බැවින් ඉදිරියේ දී එම ගෙවීම් ලැබීමට නියමිතය. ඉතිරි අයගේ ද (ඒ.ටී.ජයවීර මයා) ණය ශේෂය අර්ථසාධක අරමුදලින් 2012.10.30 දින අඩුකරගෙන ඇත.

## 4.4 <u>නිශ්ක්‍රීය ඌණ උපයෝජිත වත්කම්</u>.

(අ). එකඟ නොවේ. දක්වා ඇති වටිනාකමෙන් රු.2,076,597/-ක මුදලක් බාහිර පර්යේෂණ අරමුදලක් නොව වෛද්‍ය පීඨ සංවර්ධන අරමුදලට අදාළ ශේෂයක් වන අතර එය නිවැරදි වර්ගීකරණය යටතේ පෙන්වීමට කටයුතු යොදා ඇත. ඉතිරි එක් පර්යේෂණ අරමුදලක් සම්පූර්ණයෙන් (ආර්ජී/06/ඒජී/11) මේ වනවිට වියදම් දරා අවසන් වී ඇත. ඉතිරි පර්යේෂණ දැනට ක්‍රියාත්මකව පවතී.

(ආ). මානව ශාස්ත්‍ර පීඨයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ විදේශිය සිසුන් සඳහා චීන බෞද්ධ සංගමය මගින් ඇමරිකානු ඩොලර් 50,000 ක මූලික ධන පරිත්‍යාගයකින් සිවු මහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා යෝජනා වූ අතර, එම ව්‍යාපෘතිය 2011.09.13 දින පාලක සභාව විසින් අනුමත කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා රාජය ඉංජිනේරු සංස්ථාව මගින් මෙම ව්‍යාපෘතියේ මූලික ඇස්තමේන්තු සහ සැලසුම් පිළියෙල කරවාගෙන ඇත. නමුත් මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය අරමුදල් මෙතෙක් නොලැබුණු අතර අදාළ අරමුදල් ඉදිරියේදී රැස්කර ගන්නා තෙක් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවා ඇත.

4.5. **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු.**

**නවීන ආපනශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම.**

කොන්ත්‍රාත්කරු විසින් මෙතෙක් අවසක් බිල්පත ඉදිරිපත් කර නොමැත. උපදේශක සමාගම විසින් කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇතත් මෙතෙක් පිළිතුරක් ලැබී නොමැත. කෙසේ වුවද මෙතෙක් ඉටු කරන ලද වැඩ වටිනාකම සළකා මෙම ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්ගත කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.

4.6. **කාර්ය මණ්ඩල පරිපාලනය.**

2012.12.31 දිනට පැවති තනතුරු පුරප්පාඩුවලින් බොහොමයක් තනතුරු 2014.04.30 දින වනවිට සම්පූර්ණ කර ඇත. කෙසේ වෙතත් වාර්ෂිකව ඇති වන විශ්‍රාම ගැනීම්, සේවයෙන් ඉල්ලා අස්වීම් හා ධූරය හැරයාම් හේතුවෙන් පුරප්පාඩු ඇතිවීම නොවැලැක්විය හැක්කකි.

2014.04.30 දිනට

| | **අනුමත සංඛ්‍යාව** | **තථ්‍ය සංඛ්‍යාව** | **පුරප්පාඩු** |
|---|---|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 632 | 556 | 76 |
| පරිපාලන, විධායක හා වෙනත් ශ්‍රේණි | 41 | 29 | 12 |
| අධ්‍යයන සහායක | 49 | 38 | 11 |
| ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | 836 | 745 | 91 |
| වෛද්‍ය නිලධාරී කාර්ය මණ්ඩලය | 04 | 04 | -- |

කෙසේ වුවද පුරප්පාඩුව පවතින තනතුරු සඳහා බඳවාගැනීම් කටයුතු අඛණ්ඩවසිදුකරමින් පවතී.

4.7. **සේවක පාරිතෝෂික වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම.**

ඉදිරියේදී මහාභාණ්ඩාගාරයෙන් මුදල් ලබාගෙන මේ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට සටහන් කරගෙන ඇත.

5. **ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය**

5.1. **ක්‍රියාකාරී සැලැස්ම.**

2012 වර්ෂයට අදාළව කාර්යයන් ඉටුකිරීමේ කාල රාමුව, මූල්‍යායනය ආදී විස්තර ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. 2012 මුල් අර්ධ වර්ෂය ප්‍රගති වාර්තා සකස් කර ඇති අතර 2012 වර්ෂයේ ඉටුකර ගැනීමට අපොහොසත් වූ කාර්යයන් පිළිබඳව ඇගයීම් සිදුකර 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත.

5.2. ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත.

5.3.<u>අයවැය ලේඛනමය පාලනය.</u>

අයවැය ලේඛන සකස් කළද එම සම්පූර්ණ අයවැය ගත ප්‍රමාණයටම භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන නොලැබෙන බැවින් අයවැය ගත මුදල හා සත්‍ය වියදම අතර විචලනයන් ඇතිවීම නොවැලැක්විය හැක.

5.4. <u>නොවිසඳී ඇති විගණන ජේද පිළිබඳ නිරීක්ෂණ</u>

2009 වර්ෂය දක්වා තැන්පත් කරන ලද්දේ වෙනම තැන්පත් ගිණුමක් යටතේ ය. 2010 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේ දී එතෙක් අනුගමනය කරමින් තිබූ ගිණුම් ක්‍රියාවලිය වෙනුවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති තුමාගේ 2000/10/18 දිනැති යූජීසී/සී/පීඑස්/60 දරණ ලිපියෙන් අවසර දී තිබූ පරිදි 15% ක මුදලක් විශ්වවිද්‍යාලයේ පොදු අරමුදල බැරකර ගැනීමට අවසර දෙමින් නිකුත් කරන ලද ලිපිය අනුව 15% ක මුදලක් ලියාපදිංචි ගාස්තු යටතේ ද 85% ක් පීඨ සංවර්ධන වැඩ වෙනුවෙන් වැය නොවූ ගිණුමක පවත්වාගෙන යන ලදී. දැනට මෙම 85% වැය කිරීම සඳහා පාලක සභා අනුමැතිය ලබාගෙන වියදම් දරමින් පවතී. කෙසේ වුවද 2013 වර්ෂයේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

6. <u>පද්ධති හා පාලන.</u>

පෙන්වා දී ඇති පද්ධති හා පාලන අඩුපාඩු නිවැරදි කරගැනීමට අවධානය යොමු කර ඇත.

**මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර**

**උපකුලපති.**

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

### පීඨයේ මෙහෙවර

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ මෙහෙවර නම් ආයතනවල කළමනාකරණ ධූර භාර ගත හැකි අධ්‍යාපන අංශයෙන් හා වෘත්තීයභාවයෙන් දක්ෂ නිලධාරීන් බිහි කිරීමත්, ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීමත්, වාණිජ හා කළමනාකරණය යන විෂයයන් පිළිබඳ දැනුම පුළුල් කිරීමත් වේ.

### පීඨය හැඳින්වීම

වාණිජ හා කළමනාකරණ පීඨය, කැලණිය විශ්වවිද්‍යාලයේ කණිෂ්ඨතම පීඨය වන අතර ගුණාත්මක උපාධිධාරීන් බිහි කිරීම, සුදුසුකම්ලත් පීඨය, හා විවිධාංගීකරණය වූ පළමු උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් අනුව බලන කළ, රටේ ඇති සීඝ්‍රයෙන් වර්ධනය වන, හොඳම පීඨ අතුරින් එකකි. 1976 වසරේ දී සමාජ විද්‍යා පීඨය යටතේ වාණිජ දෙපාර්තමේන්තුව පිහිටුවීම මෙම පීඨය ආරම්භය විය. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ, ශිෂ්‍යයන්ගේ සහ අනෙකුත් පරදුතබන්නන්ගේ කැපවීම හා උත්සාහය සමඟ 1995 වසරේ දී පීඨ තත්ත්වය අත්කර ගැනීමට හැකි විය. අභිමානවත් ජීවිතයකට ඇති ගෞරවය සමඟ ජාතියට සේවය කිරීම උදෙසා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කර ගැනීමේ අවස්ථා සලසා දෙමින් විශිෂ්ඨත්වය අත් කර ගැනීම වෙනුවෙන් පීඨය කැපවී සිටී. මෙම ප්‍රතිපත්තිය අනුව යමින් පීඨයේ ඉගැන්වීමේ මාධ්‍ය, ශත වර්ෂයේ ගෝලීය භාෂාව වන ඉංග්‍රීසි වි ඇත.

මෙම මෙහෙවර අනුව කටයුතු කරමින්, පීඨය රටේ ආර්ථිකය හසුරුවන, සිවිල් සමාජයට ආධාර දෙන, ආණ්ඩුවට නායකත්වය දෙන හා සමස්ත සමාජයට බලපාන වැදගත් තීරණ ගන්නා විද්වතුන් හා වෘත්තීයවේදීන් බිහි කිරීමට සිය අප්‍රතිහත දායකත්වය නොමසුරුවම ලබා දෙයි. ඒ අනුව වාණිජ හා කළමනාකරණ පීඨය මේ වන විට උපාධිධාරීන් 8000ක් පමණ බිහි කර ඇති අතර ඔවුන්ගෙන් බහුතරය දේශීය මෙන්ම විදේශීය රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල ප්‍රමුඛ පෙළේ කළමනාකරණ ධූරවල කටයුතු කරති. තවද, අපේ උපාධිධාරීන් දිවයිනේ ප්‍රමුඛ ව්‍යවසායකයන් බවට ද පත්ව සිටිති.

## පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

### ඉදිරි දැක්ම

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ ඉදිරි දැක්ම ඈත අතීතයේ සිට අධ්‍යාපනයේ පරිමාර්ථ මත පාදක වී ඇත: එනම් එය පාලි භාෂාවෙන් පවසතොත්*NatthivijjaaSama.mpa~n~naa*එසේත් නොමැති නම් *ipsascientiapotestasest* [ලතින්] ‘දැනුම පරම බලය වේ.’

මෙම ආදර්ශ පාඨය අනුව යමින්, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය උපාධිධාරීන්ට සිය පර්යේෂණ සඳහා වූ කැපවීම, නව අදහස් කෙරෙහි විවෘතභාවය හා විශ්ලේෂණ නිපුණතාවන්ගේ ප්‍රවීණත්වය හරහා විවිධ ක්ෂේත්‍රවල බලය අත් කර ගැනීම පිණිසත් ලෝකය වඩාත් යහපත් ස්ථානයක් කිරීම පිණිසත් අවශ්‍ය දැනුම උපාධිධාරීන්ට අත් කර දීමට කැපවී සිටී.

### මෙහෙවර

පශ්චාත් උපාධි මට්ටමේ පර්යේෂණ දිරිමත් කිරීමත් දැනුම බෙදා හැරීමත් පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ මෙහෙවර වේ.

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල විශිෂ්ඨත්වය ප්‍රවර්ධනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලය තුළ සියලුම පීඨවල කාර්ය මණ්ඩලය, ශිෂ්‍යයන් හා පරිපාලන කාර්ය මණ්ඩලය සමඟ කටයුතු කරනු ලබයි. කැළණිය විශ්වවිද්‍යාලය තුළ පශ්චාත් උපාධි අධ්‍යාපනය හවුල් අත්දැකීමකි. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය ශාස්ත්‍රපති, දර්ශනපති හා ආචාර්ය උපාධි මට්ටම්වල වැඩසටහන් පිරිනැමීම සඳහා සිය ශිෂ්‍යයන්ට ගතික බුද්ධිමය පරිසරයක් නිර්මාණය කිරීමට විශ්ව විද්‍යාලයේ සියලුම අධ්‍යයන දෙපාර්තමේන්තු සමඟ එක්ව කටයුතු කරයි.

### ක්‍රියාකාරකම්

විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පර්යේෂණ පිළිබඳ ප්‍රධාන ආයතනය ලෙස පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් වාර්ෂික පර්යේෂණ පරිසංවාදය පවත්වනු ලබයි. ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාලවල කරන ලද පුරෝගාමී කාර්යයන් තුළින් පර්යේෂණ අංශයේ ඉතා සාර්ථක විද්වතෙක් වන මහාචාර්ය මලික් පීරිස් FRS 2012 වසරේ ප්‍රධාන කථිකයා විය. කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ,නිර්දේශකයක් හා පූර්ව-සමාලෝචිත වාර සඟරාව වන පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ වාර සඟරාව (*Journal of the Faculty of Graduate Studies*) 2012 වසරේ වාර්ෂික පර්යේෂණ පරිසංවාදයේ දී දියත් කරන ලදී. පර්යේෂණ ක්‍රමවේදය, විද්‍යානුකූල ලිවීම, ආචාර විද්‍යාත්ම සැලකිලිමත්වීම්, ඉදිරිපත් කිරීමේ නිපුණතා ආදිය පිළිබඳව අදාළ පාඨමාලා ඇතුලත් කරමින් දර්ශනපති හා ආචාර්ය උපාධි වැඩසටහන් අනුකූලන කිරීමට හා ප්‍රති-ව්‍යුහගත කිරීමට පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සැලසුම් කරයි.

## මානවශාස්ත්‍ර පීඨය

### ඉදිරි දැක්ම

කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨයේ ඉදිරි දැක්ම වන්නේ කැපවීමෙන්, නිර්මාණශීලීව හා ප්‍රඥාවෙන් යුත් ඉගෙනුම් හා අධ්‍යයන කටයුතුවල නියැලි ස්වාධීන විද්වතුන් බිහි කිරීම තුළින් මව් රට පෝෂණය කිරීමයි.

#### මෙහෙවර

සම්පත් වැඩිදියුණු කිරීම සහ මානවශාස්ත්‍ර හා ශ්‍රී ලංකාවේ සංස්කෘතීන්වල පර්යේෂණ කර ගෙන යාම සඳහා පහසුකම් සලසා දීම හරහා අධ්‍යාපන හා පර්යේෂණය සඳහා අද්විතීය කේන්ද්‍රස්ථානයක් ගොඩනැගීම පීඨයේ මෙහෙවර වේ. ශ්‍රී ලංකාවේ විවිධ සංස්කෘතීන්වල විවිධත්වය හා බහු-භාෂා තත්ත්වය පීඨය තුළින් නිරූපණය කරන අතර චීන, කොරියානු, ජපන්, හින්දි, ඉංග්‍රීසි, ප්‍රංශ, හා ජර්මන් අධ්‍යයන හරහා සමකාලීන අධ්‍යයනයක් පවත්වා ගෙන යන අතර පාලි, සංස්කෘත, සිංහල, දෙමළ, වාග්විද්‍යාව හා බෞද්ධ දර්ශනය ආදී ශ්‍රී ලංකාවේ උරුමය පිළිබඳ පාඨමාලා පිරිනමයි.

#### ක්‍රියාකාරකම්

සිය ඉදිරි දැක්මෙන් පෝෂණය ලැබූ මානවශාස්ත්‍ර පීඨය අධ්‍යයන විශිෂ්ඨත්වය පිළිබඳ කැපීපෙනෙන කේන්ද්‍රස්ථානයක් වන අතර ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල හා සංස්කෘතික ආයතන අතර ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. දෙපාර්තමේන්තු අටක් හා ඒකක තුනක් මඟින් පවත්වනු ලබන විවිධ විෂයන් හරහා අත්කර ගත හැකි ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) සහ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය නම් ප්‍රධාන උපාධි වැඩසටහන් දෙකක් පීඨය පිරිනමයි. සිංහල, දෙමළ, පාලි, සංස්කෘත, හින්දි, ජපන්, චීන, රුසියානු, කොරියානු, ප්‍රංශ හා ජර්මනි ආදී භාෂාවන්, බෞද්ධ සංස්කෘතිය, ක්‍රිස්තියානි සංස්කෘතිය ආදී සංස්කෘතික විෂයයන් ද වාග්විද්‍යාව, පරිවර්තන ක්‍රම, බෞද්ධ දර්ශනය, සාහිත්‍ය විචාරය ආදී විශ්ලේෂණාත්මක විෂයයන් සහ ඡායාරූප ශිල්පය, සිනමාව, වීඩියෝ හා රූපවාහිනී, නාට්‍යය හා රංග කලාව, මූර්ති කලාව, සංගීතය, නර්තනය, චිත්‍ර හා ග්‍රැෆික, දෘෂ්‍ය කලා හා රංග කලා ආදී ප්‍රායෝගික විෂයයන්වලින් යුක්ත සමස්ත විෂයයන් මාලාව විවිධ භාෂාවල අපූර්ව මිශ්‍රණයකි. මෙයට අමතරව, මුළු විශ්ව විද්‍යාලයේම සිසුන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කරන ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය ද මානවශාස්ත්‍ර පීඨයට ඇතුලත් වේ. දෙවැනි භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ උපාධියක් ද එමඟින් පිරිනමයි. සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, කොන්ෆියුෂස් ආයතනය හා තානාපති කාර්යාල කීපයකට අනුබද්ධ මධ්‍යස්ථාන ද පීඨය මඟින් පවත්වා ගෙන යනු ලැබේ.

2012 වසරේ දී HETC Window 3 ව්‍යාපෘතියේ අනුග්‍රහය යටතේ "ශ්‍රී ලංකාවේ භාෂක සමාජ පිළිබඳ සාක්ෂි ලේඛණගත කිරීම" (Document Evidence of the Discourse Communities of Sri Lanka) සඳහා ලෝක බැංකුවෙන් පර්යේෂණ ප්‍රදානයක් පීඨයට ලබා දෙන ලදී. බහු-විෂයය හා අන්තර්-පීඨ ව්‍යාපෘතියක් වන මෙම ව්‍යාපෘතිය සඳහා ආබාධ අධ්‍යයන දෙපාර්තමේන්තුව හරහා වෛද්‍ය පීඨය ද ලේඛනාගාරයක් ගොඩ නැගීමට මාර්ගෝපදේශය සැපයීම හරහා පුස්තකාලය ද පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළු පැවැත්වීම හරහා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය ද එක්ව කටයුතු කරයි. ශ්‍රී ලංකාවේ සංස්කෘතීන් හා භාෂාවන් සම්බන්ධ භාරකරු ලෙස මානවශාස්ත්‍ර පීඨයේ විවිධාකාර කාර්යභාරයන් මෙම ව්‍යාපෘතිය තුළින් නිරූපණය වේ.

## වෛද්‍ය පීඨය

### ඉදිරි දැක්ම

වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුම උත්පාදනය කිරීමට හා බෙදා හැරීමට ආධාර කිරීම මඟින් විශිෂ්ටත්ව හා ඍජු සංස්කෘතියක් තුළ උසස් අධ්‍යාපනය පිළිබඳ අන්තර්ජාතික වශයෙන් පිළිගත් ආයතනයක් වීමට පීඨය අපේක්ෂා කරයි.

### මෙහෙවර

වෛද්‍ය පීඨය වෛද්‍ය සිසුන්ට, පශ්චාත් උපාධි වෛද්‍යවරුන්ට, සම සෞඛ්‍ය රැකවරණ වෘත්තීයවේදීන්ට සහ මහජනයාට අධ්‍යාපනය ලබා දෙයි; මනුෂ්‍යයන්ට වැළඳෙන රෝගාබාධ වැළැක්වීමට, රෝග නිශ්චය කිරීමට හා ප්‍රතිකාර කිරීමට රෝගීන් ඉලක්ක කර ගත් වෛද්‍ය රැකවරණය සපයයි; විපරම, මුල් පිරීම, සමානාත්මතාවය හා සමාජීය වගකීම යනාදී ජීවගුණ පෝෂණය කරන උසස් තත්ත්වයේ අධ්‍යාපනික පරිසරයක් තුළ මූලික, ව්‍යවහාරික හා සායනික පර්යේෂණ පවත්වයි. පීඨයේ උපාධිධාරීන්ට ගෝලීයකරණය වූ සෞඛ්‍ය රැකවරණ පරිසරයක් තුළ තනි පුද්ගලයින් හා අදහස් දරන නායකයින් ලෙස සිය ප්‍රජාවට, රටට හා ලෝකයට සාර්ථකව සේවය කිරීම පිණිස අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප සතු වන ඇත.

වෛද්‍ය පීඨයේ දී ඉගැන්වීමට, ශිෂ්‍යයන් පුහුණු කිරීමට හා විද්‍යාත්මක විමසුම සඳහා උද්යෝගය ඇති ශාස්ත්‍රීය ප්‍රජාවක් මඟින් දැනුම ලබා දෙනු ලැබේ. ඉගෙනුම හා පර්යේෂණ සඳහා අනර්ඝ පරිසරයක් ලබා දීම මඟින් අපි ඉහළම මට්ටමේ ශාස්ත්‍රීය ඥණය දිරිමත් කරන්නෙමු.

### දළ විශ්ලේෂණය

වෛද්‍ය පියය රාගම, ඉඩකඩ සහිත, අක්කර 35ක භූමි භාගයක පිහිටා ඇත. 1991 සැප්තැම්බර් මස දෛය සිසුන් 120දෙනෙක්ගේ සහභාගීත්වයෙන් එම පීඨයේ අධ්‍යයන කටයුතු ආරම්භ විය. මේ වන විට පීඨයෙන් වෛද්‍ය ශිෂ්‍ය කණ්ඩායම් දහ අටක් උපාධිය හිමි කර ගෙන ඇති අතර ඊළඟට බඳවා ගන්නා කණ්ඩායම 24වැනි කණ්ඩායම වෙනු ඇත. 2008 වසරේ දී පීඨය කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ආරම්භ කරන ලද අතර මෙම පාඨමාලාව සඳහා බඳවා ගත් පළමු ශිෂ්‍ය කණ්ඩායම 2012 වසරේ දී උපාධිය හිමිකර ගත්හ.

අද වන විට ශිෂ්‍යයන් 1000ක් පමණ පීඨයට ඇතුලත් වී සිටින අතර මොවුන් අතුරින් 800ක් පමණ වෛද්‍ය සිසුන් ද 200ක් පමණ දෙනා විද්‍යාවේදී (කථන හා ශ්‍රවණ) සිසුන් ද වෙති. ප්‍රධාන වශයෙන් දකුණු ආසියානු රටවලින් ගාස්තු අය කිරීමේ පදනම මත බඳවා ගත් විදේශ සිසුන් 50ක් ද වෛද්‍ය සිසුන්ට ඇතුලත් වේ. 110ක් පමණ වූ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් යුත් පීඨයේ මොවුන්ට අමතරව 40ක පමණ තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලයක් ද අනුබද්ධ ශික්ෂණ රෝහල්වල සේවය කරන විශේෂඥ වෛද්‍යවරු ඇතුළු බාහිර කථාකාචාර්යවරු 60ක් පමණ ද සිටිති. 2012 වසරේ දී අති සාර්ථකව සිදු කළ අක්මා බද්ධ කිරීමේ ශෛල්‍යකර්ම වැනි ශ්‍රී ලංකාවේ වෛද්‍ය ආයතන අතුරින් පර්යේෂණ සඳහා වැඩිම දායකත්වයක් දක්වන පීඨයක් ලෙස කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සිය පර්යේෂණ අංශය පිළිබඳව සාඩම්බරයෙන් කටයුතු කරයි.

## විද්‍යා පීඨය

### ඉදිරි දැක්ම

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ඉදිරි දැක්ම වන්නේ ජාතික සංවර්ධනය සඳහා මෙන්ම පොදු මහජනතාවගේ සුභසාධනය සඳහා වැදගත් දායකත්වයක් සැපයිය හැකි ඉහළ අභිප්‍රේරණයකින් යුත් උපාධිධාරීන් සහ පශ්චාත්-උපාධිධාරීන් බිහි කිරීමත්, ස්වභාවික සම්පත් තිරසර භාවිතය හා සංරක්ෂණය පිණිස වඩාත් හොඳ අවබෝධයක් ඇති කිරීමට විවිධ විද්‍යාත්මක ක්ෂේත්‍රවල පර්යේෂණ සිදු කිරීම හා උපදෙස් දීමත් උපදේශන කටයුතුවලනිරත වීමත් වේ.

### දළ විශ්ලේෂණය

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය අධ්‍යයන දෙපාර්තමේන්තු අටකින් සමන් විත වේ; ඒවා නම් උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, කාර්මික කළමනාකරණය, ගණිත ශාස්ත්‍රය, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, සංඛ්‍යානය හා පරිගණක විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව වේ. විද්‍යා පීඨය දැන් වසර තුනක සාමාන්‍ය උපාධි වැඩසටහන් තුනක්, වසර හතරක විශේෂ උපාධි වැඩසටහන් තුනක් ලෙස විද්‍යාවේදී උපාධි වැඩසටහන් හයක් පිරිනමයි. විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය, පරිසර සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය (ENCM) හා කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය (MIT) සාමාන්‍ය උපාධි වැඩසටහන් වේ. විද්‍යාවේදී (විශේෂ)උපාධිය,පරිසර සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය (ENCM) හා කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය (MIT) විශේෂ උපාධි වැඩසටහන් වේ.

2012 වසරේ දී විද්‍යා පීඨයේ දර්ශනපති හා ආචාර්ය උපාධි අපේක්ෂකයන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම පිණිස ලෝක බැංකුවේ HETC Window 3 ව්‍යාපෘතියෙන් ප්‍රදානයක් විද්‍යා පීඨය වෙත පිරිනමන ලදී. විශ්ව විද්‍යාලය මඟින් සේවාදායක ආයතනවලට සපයන උපදේශනය හරහා විශ්ව විද්‍යාලය හා කර්මාන්තය අතර සම්බන්ධතාවය ඇති කරනු ලබන EDCON ව්‍යාපෘතිය ද පීඨය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## සමාජීය විද්‍යා පීඨය

### දළ විශ්ලේෂණය

සමාජීය විද්‍යා පීඨය දෙපාර්තමේන්තු අටකින් සමන්විත වේ. මෙයට අමතරව, ක්‍රීඩා හා විනෝද ක්‍රීඩා කළමනාකරණ උපාධි වැඩසටහනක් ද පීඨය මඟින් පවත්වනු ලැබේ. ශාස්ත්‍රවේදී උපාධිය සඳහා විෂයයන් 15ක් පීඨය මඟින් පිරිනමයි. මෙම විෂයයන්වලින් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) සහ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය අධ්‍යයන කිරීමට ශිෂ්‍යයන්ට හැකියාව ඇත. පීඨයේ විවිධ දෙපාර්තමේන්තු මඟින් අදාළ උපාධි වැඩසටහන් සඳහා දේශන සහ වෙනත් ඉගැන්වීමේ පන්ති පැවැත්වීමට අමතරව සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම පිණිස විවිධ ක්ෂේත්‍රවල විද්වතුන්ගේ සහභාගීත්වය ඇති දේශන, වැඩමුළු හා සම්මන්ත්‍රණ ආදිය ද පවත්වයි.

තවද, සමාජීය විද්‍යා පීඨයේ තෝරා ගත් විෂයයන් පිළිබඳ උපාධි, සහතිකපත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා ද පශ්චාත් උපාධි පාඨමාලා ද (එක් වසරක) ශාස්ත්‍රපති පාඨමාලා සහ (වසර දෙකක) සමාජ විද්‍යාපති පාඨමාලා ද පවත්වනු ලැබේ. පර්යේෂණ පාදකව දර්ශනපති හා ආචාර්ය උපාධිය හැදෑරීමේ පහසුකම් ද ඇත. පර්යේෂණ විද්‍යාගාරය, තොරතුරු තාක්ෂණ පහසුකම් ආදිය පීඨය සතු අනෙකුත් සම්පත් වේ.

පර්යේෂණ ක්‍රමවේදය සහ අධිලේඛණකරණය පිළිබඳ පැරණි සහ නවීන ක්‍රමෝපායන් සම්මිශ්‍රණය කරමින් 2012 වසරේ දී පුස් කොළ පොත් අත්පිටපත් කිරීමේ පුස්තකාලයක් පීඨ පරිශ්‍රය තුළ විවෘත කළේය.